# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2334/07 - 2023 මැයි මස 30 වැනි අඟහරුවාදා - 2023.05.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

**නිවේදනය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) අනු ව්‍යවස්ථාව යටතේ, ම විසින් 2022 ජූලි මස 22 දිනැති අංක 2289/43 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය වරින්වර සංශෝධනය කරන ලදුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් 2023 මැයි මස 30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**රනිල් වික්‍රමසිංහ,**
ජනාධිපති.

2023 මැයි මස 30 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

(1) එම නිවේදනයෙහි "අංක 02. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 33 අයිතමයට පසුව පහත සඳහන් අයිතමයන් ඇතුලත් කිරීමෙන්;

34. කොළඹ නෙළුම් කුළුණ ව්‍යාපාර මොඩලයක් බවට පත්කර සංචාරක මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම
35. ඉංජිනේරු උපදේශන සේවා හා ඉදිකිරීම් කටයුතු

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 34 සහ 35 අයිතමයන් පිළිවෙලින් අංක 36 සහ 37 වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;


1A - G 39613 — 359 (2023/05)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 59 අයිතමයට පසුව පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන්;

60. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම හා එහි පාලිත සමාගම් සහ ආශ්‍රිත ආයතන
61. කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්
62. නෝර්ත් සී ලිමිටඩ්
63. සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
64. ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
65. ජාතික ලුණු සමාගම
66. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
67. පරන්තන් කෙමිකල්ස් ලිමිටඩ්
68. සීමාසහිත බී.සී.සී.සමාගම
69. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
70. මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි-සිනමා උද්‍යානය
71. සීමාසහිත ලංකා ජෙනරල් ට්‍රේඩිං සමාගම

(2) එම නිවේදනයෙහි "අංක 03. තාක්ෂණ අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 3 අයිතමය ඉවත් කිරීමෙන්;

(3) එම නිවේදනයෙහි "අංක 06. ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 7 අයිතමය ඉවත් කිරීමෙන්;

(ආ) එහි II වැනි තීරුවෙහි අංක 1 අයිතමය ඉවත් කිරීමෙන්;

(4) එම නිවේදනයෙහි "අංක 08. ධීවර අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 3 අයිතමය ඉවත් කිරීමෙන් ;

(5) එම නිවේදනයෙහි "අංක 12. සෞඛ්‍ය අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 11 අයිතමය ඉවත් කිරීමෙන්;

(6) එම නිවේදනයෙහි "අංක 18. වැවිලි කර්මාන්ත අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 21 අයිතමය ඉවත් කිරීමෙන් ;

(7) එම නිවේදනයෙහි " අංක 19. කර්මාන්ත අමාත්‍ය " ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 6,8,9 හා 12 අයිතමයන් ඉවත් කිරීමෙන්;

(ආ) එහි II වැනි තීරුවෙහි අංක 7,10,11 සහ 13 සිට 30 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 6 සිට 26 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(8) එම නිවේදනයෙහි " අංක 20. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය " ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 31 අයිතමය ඉවත් කිරීමෙන්;

(ආ) එහි II වැනි තීරුවෙහි අංක 13 අයිතමය ඉවත් කිරීමෙන්;

(9) එම නිවේදනයෙහි "අංක 22. බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-;

(අ) එහි II වැනි තීරුවෙහි අංක 8 සහ 19 අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ආ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන අංක 9 සිට 18 දක්වා අයිතමයන් සහ, අංක 20 සහ 21 අයිතමයන් පිළිවෙලින් අංක 08 සහ 19 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඇ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත සඳහන් අයිතමයන් ඉවත් කිරීමෙන්;

- ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය පනත (1988 අංක 77)

(10) එම නිවේදනයෙහි "අංක 29. වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 3 අයිතමය ඉවත් කිරීමෙන් ;

EOG 05 - 0266

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.